# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date: 2025.04.12 පැය 1430 | දුරකථන අංකය Tel.NO: 011-2887973 | මගේ අංකය My NO: D/Media/Out/717/2025 | විද්‍යුත් ලිපිනය E-Mails: dir.media@police.gov.lk |


**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාතර්ා වූ වැදගත් තොරතුරු**

**01. මිය ගිය පුද්ගලයින් දෙදෙනෙකුගේ මෘත ශරීර දෙකක් හමු වීම - හාලිඇල පොලිස් වසම.**

2025.04.12 වන දින අළුයම් කාලයේ හාලිඇල පොලිස් වසමේ හාලිඇල නගරයේ කැටවල මාගර්යේ කාණුවක වැටී මියගිය පුද්ගයයෙකුගේ හා හාලිඇල බණ්ඩාරවෙල මාගර්යේ දුම්රිය පොල ආසන්නයේ ඇති මාගර්යක මිය ගිය පුද්ගලයෙකුගේ මෘත ශරීරයක් ඇති බවට හාලිඇල පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත හාලිඇල පොලිසිය විමශර්න ආරම්භ කර ඇත.

මියගිය පුද්ගලයන් වයස අවුරුදු 49 හා 61 වූ හාලිඇල හා ඇටම්පිටිය ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.

මෙම පුද්ගලයින් මිය යාමට හේතුව මෙතෙක් අනාවරණය වී නොමැති අතර මෘත ශරීර සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් පරීක්ෂණයෙන් පසු පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා මෘතශරීර බදුල්ල රෝහලේ තැන්පත් කර ඇත.

හාලිඇල පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**02. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගෝමරන්කඩවල පොලිස් ස්ථානය.**

2025.04.12 වන දින උදෑසන කාලයේ ගෝමරන්කඩවල පොලිස් වසමේ මෝරාගම ප්‍රදේශයේදී ගෝමරන්කඩවල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 32 ක් වූ පුල්මුඩේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරු 2025.04.12 වන අද දින ත්‍රිකුණාමලය ගරු මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතව ඇත. ගෝමරන්කඩවල පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 03. මාරක රිය අනතුරක් - චුන්නාකම් පොලිස් වසම.

2025.04.12 වන දින අළුයම් කාලයේ චුන්නාකම් පොලිස් වසමේ යාපනය පලාලි මාගර්යේ පුන්නාලකට්ටුවාන් සිත්තිවිනායගර් ප්‍රදේශයේදී ප්‍රධාන මාගර්යේ යාපනය දෙසට වන්නට කාමරීක දෝෂයක් හේතුවෙන් මාගර්ය නවතා තිබූ ට්‍රැක්ටර් රථයක එම දිසාවටම ගමන් ගත් යතුරුපැදියක් ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරුපැදියේ ගමන්ගත් පැදිකරු බරපතල තුවාල ලබා තෙලිප්පලේ රෝහලට ඇතුලත් කිරීමේදී මිය ගොස් ඇත. .

**මරණකරු වයස අවුරුදු 62 ක් වූ වසාවිලාන් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය තෙලිප්පලේ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර අනතුර සම්බන්ධයෙන් ට්‍රැක්ටර් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. චුන්නාකම් පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**